**ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්වාගණනය කළ මතය**

**-------------------------**

ආහාර කොමසාරිස්දෙපාර්තමේන්තුවේ2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස්දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝම්බර් 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ආහාර කොමසාරිස්දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළමතය සඳහා පදනම**

**-----------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍යප්‍රකාශයසම්බන්ධයෙන්ප්‍රධානගණන්දීමේනිලධාරීගේභාගණන්දීමේනිලධාරීගේවගකීම**

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ භාගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනයපිළිබඳවිගණකගේවගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමෙ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.203,819,838 ක්වූ වෙනත් ලැබීම් වටිනාකම තුල ආහාර මිලදී ගැනීමේ හා බෙදාහැරීමේ ඇවර අත්තිකාරම් ගිණුම සමාලෝචිත වර්ෂයේදී අවසන් කර රජයේ ආදායමට මාරු කළ රු.76,673,230 ක්වූ ක්ෂය සංචිත අරමුදල් ශේෂයද ඇතුළත්ව තිබුණි. | මෙහෙයුම් කටයුතුවලින් ලද වෙනත් ලැබීම් වටිනාකම පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ගිණුම්ගත කළ යුතු වීම. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳප්‍රකාශනය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය**<br>-------------------- | **නිර්දේශය**<br>---------------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>-------------- |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ තක්සේරු කරන ලද රු.347,410,000 ක්වූ ගොඩනැගිලි වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම තුල ඇතුළත් වී නොතිබුණි. | දේපල පිරියත උපකරණ වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දින වන විටත් එකතුව වර්ග අඩි 479,603 ක්වූ ගොඩනැගිලි 34 ක් හා දිස්ත්‍රික්ක 07 ක පවතින ඉඩම් කැබලි 14 ක් තක්සේරු කර දෙපාර්තමේන්තුවේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි ඉඩම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | එකඟ වෙමි. භෞතිකව පරීක්ෂා කර තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට දඹුල්ල උෂ්ණත්ව පාලන ගබඩාව ඉදිකිරීම සඳහා වැය කරන ලද රු.188,567,539 ක්වූ වටිනාකම කෙරීගෙන යන වත්කම් ලෙස සහ ප්‍රාග්ධන වත්කම් සංචිත ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | කෙරීගෙන යන වත්කම් සහ ප්‍රාග්ධන සංචිත නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනයේඇමුණුමක් ලෙස ඇතුලත් කර ඇත. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට දඹුල්ල උෂ්ණත්ව ගබඩාව ඉදිකිරීමවෙනුවෙන් අදාල නොපියවූ අත්තිකාරම් රු.48,659,281 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුමක් ලෙස ඇතුලත් කර ඇත. |

### 1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රු.332,250 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර පවතින වෙනස නිරවුල් කළ යුතු වීම. | පෙර වර්ෂවල සිටම පැවත එන වෙනසක් බවත් වෙනසට හේතු හඳුනාගැනීමට නොහැකි වී ඇත. |
| (ආ) | 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලින් බැහැරව නිලධාරීන් 21 කුගෙන් වසර 20 කට අධික කාලයක සිට අයවිය යුතු රු.739,967 ක් වූ හිඟ ණය ශේෂ තොරතුරු සොයාගත නොහැකිවීම හේතුවෙන් හානි පාඩු ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය මත කපාහැර තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතු වීම. | 2020 ගිණුම සකස් කිරීමේදී වරද නිවැරදි කරන බව දන්වමි. |

### 1.6.4 ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආහාර මිලදීගැනීමේ හා බෙදාහැරීමේ ඇවර අත්තිකාරම් ගිණුමේ අයකර ගත නොහැකි ණය ගැතියන් හා කාරක අලාභ ලියා හැරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 200ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම ප්‍රතිපාදන භාවිතා නොකර ඇවර කිරීමේ මණ්ඩලයේ තීරණය අනුව ගිණුම අවසන් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් | නිසි සැලැස්මකින් යුතුව වාර්ෂික ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු වීම හා දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් සැසඳුම් කළ යුතු වීම. | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ආහාර මිලදී ගැනීමේ හා බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුමේ ශේෂයක් නොතිබුණද භාණ්ඩාගාර පොත් අනුව එහි ශේෂය රු.1,719,406 ක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව අවශ්‍යතාවය හඳුනාගෙන නිසි පූර්ව ඇගයීමකින් ඇස්තමේන්තු සකස් කළ යුතුයි. එසේ වුවද, පුනරාවර්තන වැය විෂයයක් සඳහාසමාලෝචිතවර්ෂයේදී ඇස්තමේන්තුගත 4+ප්‍රතිපාදනයෙන් සියයට 35 ක අධිප්‍රතිපාදනයක් සලසාගෙන තිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන පූර්ව ඇගයීමකින් ඇස්තමේන්තු පිළියෙලකළ යුතු වීම. | වේයන්ගොඩ ධාරිතාවය මෙ.ටො.50,000 ක් සහල් ගබඩා කිරීම සඳහා සකස් කර තිබෙන විද්‍යාත්මක ගබඩා 06 ක් සඳහා විදුලි ප්‍රතිපාදන ලබාගෙන ඇත. සහල් ගබඩා කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති තීරණ අනුව වෙනස්වන බැවින් එක් එක් කාලපරිච්ඡේදවල සහල් අතිරික්තයක් ඇතිවන අවස්ථාවල සහල් ගබඩා කිරීම සඳහා මෙම ඇස්තමේන්තු සකස් කර ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව විදේශ ප්‍රදාන යටතේ සිදුකළ රු.99,820,040ක්වූ වියදම මූල්‍ය ප්‍රකාශනවල දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ දරන ලද වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් තැබීම් නිවැරදිව සිදු කළ යුතු වීම. | එකඟ වෙමි. ඉදිරියේදී නිවැරදි කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලැබීම් රු.400,000,000 ක් වුවද, රු.195,000,000 ක් ලෙස දක්වා තිබුණි. | ගිණුම් තැබීම් නිවැරදිව සිදු කළ යුතු වීම. | එකඟ වෙමි. |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශ්‍රාමගිය, මියගිය, වැඩ තහනම් කළ හා සේවය අතහැර ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,213,414 ක ණයශේෂ වසර 5 කට වැඩි කාලයක සිට හිඟව පැවතුනි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විශ්‍රාමගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන්විශ්‍රාම වැටුපෙන් අයකර ගත හැකි බවත්, එක් නිලධාරියකුගේ ණයශේෂය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හා අනෙක් නිලධාරියාගේ ණයශේෂය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. වැඩ තහනම් කළ නිලධාරීයකු වාරික ගෙවීම් කරන බවත්, අනෙක් නිලධාරින්ගේ ණය අයකර ගැනීමට නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇති බවත් අනෙකුත් නිලධාරීන් සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදී පොත් වලින් ලියා හැරීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යය වන අර්බුදකාරී අවස්ථාවන්හිදි ප්‍රයෝජනයට ගැනීම සඳහා මෙ.ටොන් 100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගත යුතුයි. එම අරමුණ ඉටුකර ගැනීමේ සඳහා මෙ.ටොන් 34,300 ක් ගබඩා කළ හැකි වේයන්ගොඩ පරිශ්‍රයේ ගබඩා 06 ක් රු.292,311,945 ක් වැයකර විද්‍යාත්මක ගබඩා බවට පත් කර තිබුණි. එසේ වුවද 2013 වර්ෂයේ නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය ඇගයීම සඳහා ගබඩා කරන ලද මෙ.ටොන් 668 ක සහල් තොගය අවසන් වීමෙන් පසුව 2019 දෙසැම්බර් 31 දින දක්වාම කිසිදු ආරක්ෂිත සහල් තොගයක් දෙපාර්තමේන්තුව සතුව නොපැවතුනි. | දැක්ම හා මෙහෙවර ඉටු වන පරිදි ඉටු කළ යුතු කාර්යභාරය ප්‍රමුඛව ඉටු කිරීම සිදු කළ යුතු වීම. | සහල් සංචිත පවත්වාගෙන යාමට වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදනය ඉල්ලුම් කලද ප්‍රතිපාදන ලබා දී නොතිබුණි. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු ගබඩාවන් සහ නිවාස මනා උපයෝජනයට ලක් කිරීම සඳහා අතිරික්ත ගබඩා හා නිවාසතක්සේරු කර එමතක්සේරුව පදනම් කොට කුළියට ලබාදීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වයක් දැක්වීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වුවද, මේ සම්බන්ධයෙන් වූ සැලසුම් කිසිවක් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර නොතිබුණි. | ප්‍රධාන කාර්යයන් ඉටුකර ගන්නා ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතු වීම. | 2019 ක්‍රියාකාරී සැලැස්මටඇතුලත් නොවුවද 2019 වසරේදී දෙපාර්තමේන්තු ගබඩා කුලියට දීමෙන් රු.95,513,144.92 ක ආදායමක් සහ දෙපාර්තමේන්තු නිවාස කුලියට දීමෙන් රු. 6,127,997.62 ක ආදායමක් ඉපයීමට සමත් විය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඔරුගොඩවත්ත, අම්පාර, හම්බන්තොට, කහදාව, යාපනය, නුවරඑළිය, බදුල්ල ගබඩා කිසිවක් අලුත්වැඩියා කටයුතු සිදු කර නොතිබුණි. එසේ වුවද, ක්‍රියාකාරී සැලැස්මට අනුව ගබඩා අලුත්වැඩියාව සඳහා රු.මිලියන 311.58ක්වූ ප්‍රතිපාදිත මුදලින් මූල්‍ය ප්‍රගතිය 93.25 ක්ද භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලෙස ප්‍රගති වාර්තාවේ දක්වා තිබුණි. | ප්‍රගති වාර්තා නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | ඉල්ලුම් කල ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරයෙන් නොලැබුණ ද ලැබුණු ප්‍රතිපාදන අනුව ශ්‍රාවස්තිපුර, බූස්ස සහ මැද්දවත්ත ගබඩා අලුත්වැඩියා කරන ලදී. |
| (ඈ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව යන්ත්‍ර උපකරණ මිලදී ගැනීමේදී රු.මිලියන 5.63ක්වූප්‍රතිපාදිතමුදලින් රු.මිලියන 5.5ක්වූෆෝක්ලිප්ට් යන්ත්‍රය මිලදීගෙන නොතිබියදී මූල්‍ය ප්‍රගතිය සියයට 99 ක් හා භෞතික ප්‍රගතිය සියයට 99 ක් ලෙස ප්‍රගති වාර්තාවේ දක්වා තිබුණි. | ප්‍රගති වාර්තා නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | සහල් සංචිත පවත්වා ගැනීමක්2019 වසර තුළදී සිදු නොවූ බැවින් ෆෝක්ලිෆ්ට් රථයක් මිලදී ගැනීමක් සිදු නොවුණි. |
| (ඉ) | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්,ගබඩා, නිවාස සඳහා වූ නෛතික ක්‍රියාමාර්ග ගැනීම් ලෙස වාර්ෂික භෞතික ඉලක්කය සියයට 100 ක් ලෙස ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ඉන් ලඟා කර ගෙන තිබුණේ සියයට 30 ක් පමණි. | නෛතික ක්‍රියාමාර්ග ගැනීම් කඩිනම් කළ යුතු වීම. | නෛතිකක්‍රියා මාර්ගගැනීම්කටයුතු වලදී තීරණ ගනු ලබන්නේ ගරු අධිකරණය විසිනි. අධිකරණ කටයුතුපාලනය කිරීමේ බලය දෙපාර්තමේන්තුවට නොමැති බැවින් නෛතික ක්‍රියා මාර්ග ගැනීම්හි 100%ක ප්‍රගතියක් අත්පත් කර ගැනීමට නොහැකි විය. |
| (ඊ) | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල අයිතිය පවරාගැනීමේ ළඟාකරගත් ඉලක්කය සියයට 25 ක් ලෙසක්‍රියාකාරී සැලැස්මට අදාල ප්‍රගති වාර්තාවේදක්වා තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු ඉඩමක අයිතිය පවරාගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කළ යුතු වීම. | ඉඩම්වල අයිතියපවරාගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර එම කටයුතු එක් එක් අදියරයන්හි ක්‍රියාත්මක වෙමින් පවතී. |

**3.2 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුවදෙපාර්තමේන්තුවේ ඉඩම් ගොඩනැගිලිවල වටිනාකම රු.4,659,567,477 වී තිබුණද මෙමඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණු අතර ඉඩම් ආඥා පනත යටතේ ලබාදෙන ලද ඉඩම් පැවරීමේ සහතිකය ලබාගෙන නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගත යුතු වීම. | පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනටරු.89,462,175 ක්වූඅයවිය යුතු ගබඩා කුලියෙන් රු.58,870,238 ක්වූ ගබඩා කුලී අයකර ගත නොහැකි වීම හේතුවෙන් එම ගබඩා දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණි.පවරාගත් ගබඩා වලින් අයවිය යුතු ගබඩා කුලී රු.4,506,576 ක් අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණද එම නඩු කිසිවක් වාර්තාවේ දින වන විටත් විසඳී නොතිබුණි.තවද දෙපාර්තමේන්තුව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අයවිය යුතු ගබඩා කුලී රු.54,369,662ක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | හිඟ ගබඩා කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ගබඩා කුලී අයකර ගැනීම සඳහා නියමිත පරිපාටියට අනුව කටයුතු කර ඇති අතර අදාල ආයතන වෙත වරින් වර සිහි කැඳවීම් මගින් දැනුම් දී ඇත. ආයතනය සමග වාචිකව සාකච්ඡා කර විසඳුම් ලබා ඇති අතර අවසන් වශයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. |
| i. | ලංකා සතොස ආයතනයට ලබාදී තිබූ ගබඩා 09 ක් සම්බන්ධයෙන් 2014 සැප්තැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා අයවිය යුතු හිඟ කුලිය රු.22,607,500 ක් විය. | හිඟ ගබඩා කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ලංකා සතොස ආයනය දැනුවත් කර ඇත. ප්‍රතිචාරයක් ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| **ii**. | සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබාදී තිබූගබඩා 09 ක් සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලියරු.27,234,985 ක් විය. | හිඟ ගබඩා කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිඟ කුලී ගෙවන ලෙස වරින් වර ආයතනයට දැනුම් දී ඇත. |

**3.3** **කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | --------------------------- |
| (අ) | ආපනශාලාව බදු දීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර ආපනශාලාවේ සිදු කළ යුතු අලුත්වැඩියා කටයුතු හා නවීකරණ කටයුතු සිදු නොකර, පුද්ගලික සමාගමක් වෙත බදු දීම සඳහා 2019 අගෝස්තු 15 දින ගිවිසුම්ගත වී තිබුණි. එසේ වුවද එදිනට පසුව එනම් 2019 නොවැම්බර් මාසයේඇති කර ගන්නා ලද එකඟතාවය මත රු.4,951,000 ක් වැය කර නවීකරණය කර තිබුණු නමුත් නවීකරණයෙන් පසුව ආපනශාලාව සඳහා නව තක්සේරු වටිනාකමක් ලබාගෙන මාසික බදුකුලී මුදල සංශෝධනය කිරීමට කටයුතු නොකර 2015 වර්ෂයේදී තක්සේරු මිල පදනම් කරගෙන බදු දීමට කටයුතු කර තිබුණි. | අලුත්වැඩියාව සඳහා රු.6,000,000 කට වැඩි මුදලක් දරා ඇති බැවින් නව තක්සේරු වටිනාකමක් ලබා ගත යුතු වීම. | වසර 3 න් 3 ට සංශෝධනය කරන බව දන්වමි. |
| (ආ) | ප්‍රසම්පාදන සැලසුම් කිරීමේ දුර්වලතාවය හා දෙපාර්තමේන්තු ආපනශාලාව නියමිත කාලයේදී විවෘත නොකිරීම හේතුවෙන් රු.1,344,000 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. | වර්ෂය ආරම්භයේදී ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදුකළ යුතු වීම. | ලංසුකරු වෙත විධිමත් පරිදි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට භාර දී නොමැති බැවින් හිඟ කුලියක් අයකර ගැනීම සාධාරණ නොවන බව නිරීක්ෂණය කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පසුගිය වර්ෂයන්හිදි ආපනශාලව බදු දීමෙන් අයකර ගත යුතු රු.791,190 ක් වූ හිඟ කුලිය අයකර ගැනීමට විගණිත දින වන විටත් අපොහොසත් වී තිබුණි. | හිඟ බදු කුලී කඩිනමින් අයකළ යුතු වීම. | හිඟ කුලිය අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇත. |
| (ඇ) | **වේයන්ගොඩ ගබඩා පරිශ්‍රයේ ගබඩා නවීකරණය**<br>------------------------------------------ | | |
| (i) | සාමාන්‍ය තත්ත්වයේ ගබඩා 06 ක් විද්‍යාත්මක ගබඩා ලෙස නවීකරණය කිරිමේදීවිදුලිය ධාරිතාවයේ වොල්ටීයතාවය 1000 දක්වා වැඩිකළද ගබඩා උපයෝජනය කිරීමේ නිශ්චිත සැලසුම් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගබඩාවන් නිෂ්ක්‍රීයව පැවතුණි.එසේ වුවද සමාලෝචිත වර්ෂයේ කිසිදු ගබඩාවක සහල් ගබඩා කර නොතිබුණද, 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදුලිය සඳහාරු.3,581,854ක වියදමක් දරා තිබුණි. | ගබඩා නිශ්ක්‍රීයව පැවතියද අධික විදුලිය වියදමක් දැරීමට සිදුවන බැවින් ගබඩා උපයෝජනය කිරීමේ නිසි සැලසුම් සැකසීමේ ක්‍රමවේද සකස් කළ යුතු වීම. | එකඟ වෙමි. |
| (ii) | අංක 01 සහ 13 ගබඩා අලුත්වැඩියා සම්බන්ධයෙන් දින 181 ක ප්‍රමාද කාලයක් සඳහා රු.4,886,004 ක ප්‍රමාද ගාස්තු අයකිරීමට උපදේශක ආයතනය විසින් නිර්දේශ කර තිබුණද, දෙපාර්තමේන්තුවඅයකරගෙන තිබුණේදින 31 කට අදාලව රු.819,704 ක් පමණි.තවද, ලංසු ලේඛණයේ 6.12 ඡේදය ප්‍රකාරව එම ගබඩාවන්ගේ යාන්ත්‍රික කටයුතු සිදු කළ කාලය තුල පාරිභෝජනය කළ විදුලිය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු රු.2,518,085 ක් වූ විදුලි වියදම් 2019 දෙසැම්බර් 31 දක්වාම ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | ගිවිසුමේ සඳහන් පරිදි ප්‍රමාද ගාස්තු අයකළ යුතු වීම සහ ලංසු ලේඛනයේ දක්වා ඇති පරිදි විදුලිය බිල් ප්‍රතිපූර්ණය කරගත යුතු වීම. | කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම අනුව කොන්ත්‍රාත් ගිවිසුමට සම්බන්ධ නිර්දේශ ලබාගෙන කොන්ත්‍රාත් සමාගම වෙත දින 150 ක සහන කාලයක් ලබාදී දින 31 ක දඩ මුදල් අයකිරීමට කටයුතු කර ඇත.<br>ඉදිරියේදී විදුලිය බිල ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2012 වර්ෂයේදී වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාවේ ගබඩා කිරීම සඳහා සහල් ලබාදීමේ පදනම මත 2012 හා 2013 වර්ෂයන්හිදි සහල් මෝල්හිමියන් අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව ලබාදිය යුතු සහල් ප්‍රමාණය මෝල්කරුවන් ලබානොදීමහේතුවෙන් මෝල්හිමියන්ගෙන් අයවිය යුතු මුදල රු.7,390,700 ක් විය.මේ සම්බන්ධයෙන් නිතිමය පියවර ගැනීම සඳහා 2017 වර්ෂයෙදී නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණද, වාර්තාවේ දින වන විටත් නඩු පවරා නොතිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | නෛතික කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර තිබුණු දඹුල්ල උෂ්ණත්ව පාලක ගබඩා ව්‍යාපෘතියේ කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු හෙක්ටයාර 2.0069 ක ඉඩමක් යොදාගෙන තිබු අතර 2020 අගෝස්තු 31 දින වන විටත් එම ඉඩම දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගත යුතු වීම. | පිළිතුරු ලැබී නොතිබුණි. |
| (උ) | එළවළු හා පළතුරු වල පසු අස්වනු හානිය අඩු කිරීම හා මිල උච්ඡාවචනය අවම කිරීමේ අරමුණින් දඹුල්ල උෂ්ණත්ව පාලන ගබඩා ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.188,567,539 ක මුදලක් ගෙවා තිබු අතර එදිනට භෞතිකව ප්‍රගතිය සියයට 35.5 ක් විය. | ගිවිසුම අනුව ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු වීම. | පිළිතුරු එවා නොතිබුණි. |
| (ඌ) | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සංගමය වෙත අර්තාපල් ගබඩා කිරීම සඳහා වේයන්ගොඩ අංක 08 විද්‍යාත්මක ගබඩාව2018 වර්ෂයේදී ලබාදී තිබුණි. ගබඩා කරන ලද අර්තාපල් නරක්වී ජලය කාන්දුවී ගබඩාවේ යන්ත්‍ර හා උපාංග සියල්ලම හානිවී තිබුණි. ඒ හේතුවෙන් මෙම ගබඩාව කිසිදු ප්‍රයෝජනයකට ගැනීමට නොහැකි වී තිබුණ අතර මෙම වාර්තාවේ දින වන විටත් වසා දමා වර්ෂ 1 1/2 ක් ගත වී තිබුණි. මෙම ගබඩාවට | අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම හා අලාභය අයකර අලුත්වැඩියා කිරීමෙන් පසුව ගබඩාව ඉදිකිරීමේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාල අලාභයන් නොපමාව ගෙවීමට කටයුතු කරන ලෙස සංගමය වෙත දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | සිදු වු අලාභය අදාල උපදේශක ආයතනය විසින් රු.3,315,000 කට තක්සේරු කර තිබුණද, මෙම වාර්තාවේ දින වන විටත් අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (එ) | ධාරිතාවය මෙ.ටොන් 5400 ක් වන වේයන්ගොඩ අංක 07 විද්‍යාත්මක ගබඩාව සමාලෝචිත වර්ෂයේදී වට්ටක්කා ගබඩා කිරීම සඳහා රාජ්‍ය ආයතනයකට ලබා දී තිබුණි. ගබඩාකල කාල සීමාව සඳහා ගබඩාව වෙනුවෙන් අදාල ආයතනයෙන් ප්‍රතිපූරණය කර ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් රු.1,207,339කවිදුලිය වියදමක් ගෙවා තිබුණි. ගබඩාවේ ගබඩා කරන ලද වට්ටක්කා තොගයෙන් සියයට 79.36 ක් නරක් වී තිබුණු අතර, වාර්තාවේ දින වන විටත් ගබඩාව උපයෝජනය නොකර නිශ්ක්‍රීයව පැවතුනි. | ගබඩාව උපයෝජනය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම හා විදුලිය වියදම ප්‍රතිපූර්ණය කරගත යුතු වීම. | විදුලිය වියදම ප්‍රතිපූර්ණය කර ගැනීමට දන්වා යවා ඇත |

**3.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත දේපල පිරියත**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ධාරිතාවයමෙ.ටොන් 10,800 කින් යුත් වේයන්ගොඩ අංක 09 ස්වභාවික විද්‍යාත්මක ගබඩාව සහ අංක 10 යාන්ත්‍රික විද්‍යාත්මක ගබඩා 2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා නිශ්ක්‍රීයව පැවතුනි. සහල් ආරක්ෂිත තොග පවත්වා ගැනීමේ අරමුණින් ගබඩා නවීකරණය කලද එම අරමුණ ඉටුකර ගැනීමට හෝ කුලියට දී වාර්ෂික තක්සේරු කුලී වටිනාකම රු.4,320,000 ක් වූආදායම ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගබඩා අලුත්වැඩියා කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ගබඩා උපයෝජනය සම්බන්ධයෙන් විධිමත් සැලසුම් ගැනීම හා ඒවා ක්‍රියාවට නැංවීම කළ යුතු වීම. | සහල් සංචිත පවත්වාගෙන යාමට වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන ඉල්ලුම් කලද ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා ගබඩා ප්‍රයෝජනය ගැනීමට හැකියාව නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 හා 2019 වර්ෂයන්හිදී රු.29,628,902 ක් වැය කරඅනුරාධපුර ශ්‍රාවස්තිපුර ගබඩා 02 ක් ප්‍රතිසංස්කරණය කර 2019 අගෝස්තු මාසයේදී භාරදී තිබුණි.එසේ වුවද මෙම ගබඩා ප්‍රතිසංස්කරණය කිරීමට පෙර පැවති ගබඩාවල ජීව කාලය පිළිබඳ අවධානය යොමු නොකර අළුත්වැඩියාවන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදෙසැම්බර් 31 දින වන විටත් නිශ්ක්‍රීයව පැවතුනි. | ගබඩා අලුත්වැඩියා කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීය යුතු වීම. | සහල් ගබඩා කිරීමට අපේක්ෂා වුවද අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණි. |
| (ඇ) | 2018 හා 2019 වර්ෂයන්හිදී ගාල්ල බුස්ස ගබඩා 02 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.50,101,059 ක් වැය කළද, 2020 අගෝස්තු 31 දින වන විටත් ගබඩා උපයෝජනය කිරීම සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ගබඩා අලුත්වැඩියා කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ගබඩා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | සහල් ගබඩා කිරීමට අපේක්ෂා වුවද අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණි. |
| (ඈ) | 2018 වර්ෂයේදී මාතර මැද්දවත්ත ගබඩාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.6,524,966 ක් වැය කළද, 2020 අගෝස්තු 31 දින වන විටත් ගබඩා උපයෝජනය කිරීම සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ගබඩා අලුත්වැඩියා කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ගබඩා උපයෝජනය සම්බන්ධයෙන් විධිමත් සැලසුම් සකස් කර ඒවා ක්‍රියාවට නැංවිය යුතු වීම. | රජයේ විවිධ අවශ්‍යතා ගබඩා ප්‍රයෝජනය ගනී. |
| (ඉ) | වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ පැවති වටිනාකම රු.4,500,000 ක් වූ පාලම් තරාදිය උපයෝජනය නොකිරීම හේතුවෙන් ඌණ උපයෝජිතව පැවතුනි. | පාලම් තරාදිය උපයෝජනය සම්බන්ධයෙන් විධිමත් සැලසුම් සකස් කර ඒවා ක්‍රියාවට නැංවිය යුතු වීම. | සතොස සහල් ගබඩාකර තිබූ කාලසීමාව තුල පරිහරණය කර ඇත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2008 අගෝස්තු 27 දිනැති අමප/08/1481/342/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු 18 කට අදාලව සේවකයින් 229 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඊ අමතරව අනුමත වූ තනතුරු 03 කට අදාලව තත්ත්ව පාලන නිලධාරී තනතුර සඳහා 2015 වර්ෂයේද, ධාන්‍ය සමීක්ෂක තනතුර සඳහා 2018 වර්ෂයේදීද, නිලධාරීන් දෙදෙනකු පත්කර තිබුණි. එසේ වුවද දෙපාර්තමේන්තුව සතුව ආරක්ෂිත සහල් තොග පවත්වා නොතිබීම හේතුවෙන් මෙම නිලධාරීන් සඳහා වෙනත් රාජකාරි පවරා තිබුණි. | තනතුරට අදාල රාජකාරී කටයුතු ඉටුකරවා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයක් සැකසිය යුතුය. | අවශ්‍යතාවය මත සේවයින් බඳවා ගැනීමේ කටයුතු සිදු කර ඇත. |